# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2069/35 - 2018 මැයි මස 03 වැනි බ්‍රහස්පතින්දා - 2018.05.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය

ලංකා දුම්රිය සේවක යසසාධක සංගමය

**ව්‍යවස්ථා සංශෝධනය**

දුම්රිය සාමාන්‍යාධිකාරීතුමන් නියෝජනය කරමින් සපැමිණි සහකාර පරිපාලන අධ්‍යක්ෂක ගරු එම් එන් වීරසිංහ මැතිතුමන් සහ විදුලි ඉංජිනේරු ඊ එම් ධර්මසිරි මහතාගේ සහභාගිත්වයෙන් සහ ලංකා දුම්රිය සේවක යහසාධක සංගමයේ සභාපති කේ දිලිප් ප්‍රියලත් මහතාගේ ප්‍රධානත්වයෙන් දුම්රිය මූලස්ථාන සාහිත්‍ය හා සමාජ ආයතන ශ්‍රවණාගාරයේදී 2017 අගෝස්තු 27 වන ඉරුදින පෙ. ව. 9.00 ට පවත්වන්නට යෙදුණ 1965 අංක 03 දරන ආඥාපනතින් සංස්ථාගත කළ ලංකා දුම්රිය සේවක යහසාධක සංගමයේ 45 වන මහ සභා රැස්වීමේදී සභා සම්මත වූ වර්තමාන ව්‍යවස්ථාවට ඇතුළත් කළ යුතු ව්‍යවස්ථාපිත යෝජනා

**වර්තමාන ව්‍යවස්ථාව (03) (06) අ**

සෑම සාමාජිකයෙකුම රු 500/- වූ මාසික සාමාජික මුදලක් ගෙවිය යුතුය. වාර්ෂිකව 10% ක පොලී ප්‍රතිශතයක් ගිණුමේ සඳහන් ශේෂයට වාර්ෂිකව ගණනය කොට එම පොලී ප්‍රමාණය සෑම වර්ෂයක් අවසානයේම වෙනම ගිණුමකට මාරු කර පවත්වාගෙන යා යුතු ය. එය විශ්‍රාම යාමේදී විශ්‍රාම පාරිතෝෂිකයට එකතු කොට ලබාදිය යුතු ය.

**සංශෝධිත ව්‍යවස්ථාව (03) (06) අ**

සෑම සාමාජිකයෙකුම රු 500/- වූ මාසික සාමාජික මුදලක් ගෙවිය යුතු ය. වාර්ෂිකව ගිණුමට එකතුවන මුදලට 10%ක පොලී ප්‍රතිශතයක් වාර්ෂිකව ගණනය කොට එම පොලී ප්‍රමාණය සෑම වර්ෂයක් අවසානයේම වෙනම ගිණුමකට මාරු කර පවත්වාගෙන යා යුතු ය. එය විශ්‍රාම යාමේදී විශ්‍රාම පාරිතෝෂිකයට එකතු කොට ලබාදිය යුතු ය.

**වර්තමාන ව්‍යවස්ථාව (04) 02**

සංගමයේ වාර්ෂික මහසභා රැස්වීම සෑම වර්ෂයකම මාර්තු 31 වැනි දිනට මත්තෙන් කොළඹ දිස්ත්‍රික්කයේ ඕනෑම ස්ථානයක දී පැවැත්විය යුතු ය. වාර්ෂික මහසභා රැස්වීමට ඉදිරිපත් කිරීමට අපේක්ෂිත යෝජනා සෑම සාමාජිකයෙකු විසින්ම ලිඛිතව තුන් මසකට කලින් ලේකම්/භාණ්ඩාගාරික වෙත ඉදිරිපත් කළ යුතු ය. උදාහරණ : පසු වර්ෂයේ මාර්තු 31 වන දිනට පසු නොවී පැවැත්වෙන වාර්ෂික මහසභා රැස්වීමේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන එබඳු යෝජනාවක් රැස්වීම පැවැත්වීමට පෙරාතුව එළඹෙන දෙසැම්බර් මස තිස් එක් වන දිනට මත්තෙන් ලේකම්/භාණ්ඩාගාරික වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය. මෙබඳු යෝජනා සියල්ල වාර්ෂික වාර්තා පොතට ඇතුළත් විය යුතු ය. ව්‍යවස්ථාවට අනුකූල නොවන ඕනෑම යෝජනාවක් ප්‍රතික්ෂේප කිරීමට ක්‍රියාකාරක මණ්ඩලයට බලය තිබේ.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**සංශෝධිත ව්‍යවස්ථාව (04) 02**

සංගමයේ මහසභා රැස්වීම වර්ෂ දෙකක් අවසානයේ මාර්තු 31 වැනි දිනට මත්තෙන් කොළඹ දිස්ත්‍රික්කයේ ඕනෑම ස්ථානයක දී පැවැත්විය යුතු ය. මහසභා රැස්වීමට ඉදිරිපත් කිරීමට අපේක්ෂිත යෝජනා සෑම සාමාජිකයෙකු විසින්ම ලිඛිතව තුන්මසකට කලින් ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය. උදාහරණ : මාර්තු 31 වන දිනට පසු නොවී පැවැත්වෙන මහසභා රැස්වීමේදී ඉදිරිපත් කිරීමට අදහස් කරන එබඳු යෝජනාවක් රැස්වීම පැවැත්වීමට පෙරාතුව එළඹෙන දෙසැම්බර් මස තිස් එක් වන දිනට මත්තෙන් සංගමයේ ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය. මෙබඳු යෝජනා සියල්ල වාර්ෂික වාර්තා පොතකට ඇතුළත් විය යුතු ය. ව්‍යවස්ථාවට අනුකූල නොවන ඕනෑම යෝජනාවක් ප්‍රතික්ෂේප කිරීමට ක්‍රියාකාරක මණ්ඩලයට බලය තිබේ.

**වර්තමාන ව්‍යවස්ථාව (04) 03**

ඉකුත් වාර්ෂික මහසභා රැස්වීමේ වාර්තාව, පෙරාතුව වූ සැප්තැම්බර් මාසයේ තිස්වන දින වූ පරිදි සංගමයේ වත්කම් සහ බැරකම් පිළිබඳ ප්‍රකාශයක් ඇතුළත් ශේෂ පත්‍රය, පෙරාතුව වූ වර්ෂයේ සැප්තැම්බර් මස තිස් වන දිනෙන් අවසන් වූ දොළොස්මස් කාලය තුළ සංගමයේ අය සහ වැය පිළිබඳ ගිණුම, ගිණුම් පරීක්ෂක වාර්තාව සහ සංගමයේ පාලන වාර්තාවද ඇතුළත් වාර්ෂික වාර්තාව වාර්ෂික මහසභා රැස්වීමේ දී ඉදිරිපත් කළ යුතු ය.

**සංශෝධිත ව්‍යවස්ථාව (04) 03**

ඉකුත් මහසභා රැස්වීමේ වාර්තාව, ඉකුත් වර්ෂ දෙක තුළ සංගමයේ වත්කම් සහ බැරකම් පිළිබඳ ප්‍රකාශයන් ඇතුළත් ශේෂ පත්‍ර, පෙරාතුව වර්ෂ දෙකෙහි සැප්තැම්බර් මස 30 වන දිනෙන් අවසන් වන පරිදි පිළියෙල කරන ලද වර්ෂ දෙකෙහි සංගමයේ අයවැය පිළිබඳ ගිණුම්, ගිණුම් පරීක්ෂක වාර්තාව සහ සංගමයේ පාලන වාර්තාවද ඇතුළත් වාර්ෂික වාර්තා මහසභා රැස්වීමේ දී ඉදිරිපත් කළ යුතු යි.

**වර්තමාන ව්‍යවස්ථාව (04) 04**

වාර්ෂික මහසභා රැස්වීම පැවැත්වීම සඳහා ලේකම්/භාණ්ඩාගාරික විසින් දින දහ හතරක කල්දීමක් කළ යුතු අතර, පිළිවෙලින් සිංහල දෙමළ සහ ඉංග්‍රීසි යන පුවත් පත් තුනක රැස්වීම පැවැත්වෙන දිනය වේලාව සහ ස්ථානය නිවේදනයක් ලෙසින් පළ කළ යුතු ය. වාර්ෂික මහසභා රැස්වීම පැවැත්වීමට දින දහහතරකට පෙරාතුව සාමාජිකයින් අතර න්‍යාය පත්‍රය සහිත මුද්‍රිත වාර්තා පොත් බෙදා හැරිය යුතු ය. න්‍යාය පත්‍රය සහ වාර්ෂික වාර්තා පොත් නොලද යම් සාමාජිකයෙකුට ලේකම්/භාණ්ඩාගාරික මහතාගෙන් ඉල්ලුම්කොට පිටපතක් ලබාගත හැකි ය.

**සංශෝධිත ව්‍යවස්ථාව (04) 04**

මහසභා රැස්වීම පැවැත්වීම සඳහා සංගමයේ ලේකම් විසින් දින දහ හතරක කල්දීමක් කළ යුතු අතර, පිළිවෙලින් සිංහල දෙමළ සහ ඉංග්‍රීසි යන පුවත් පත් තුනක රැස්වීම පැවැත්වෙන දිනය වේලාව සහ ස්ථානය නිවේදනයක් ලෙසින් පළ කළ යුතු ය. මහසභා රැස්වීම පැවැත්වීමට දින දහහතරකට පෙරාතුව සාමාජිකයින් අතර න්‍යාය පත්‍රය සහිත මුද්‍රිත වාර්තා පොත් බෙදා හැරිය යුතු ය. න්‍යාය පත්‍රය සහ පිළියෙළ කරන ලද වාර්ෂික වාර්තා පොත් නොලද යම් සාමාජිකයෙකුට ලේකම් මහතාගෙන් ඉල්ලුම්කොට පිටපතක් ලබාගත හැකිය.

**වර්තමාන ව්‍යවස්ථාව (04) 05**

වාර්ෂික මහසභා රැස්වීමේ ගණපූරණය සාමාජිකයන් හැත්තෑපස් දෙනෙකු වේ.

**සංශෝධිත ව්‍යවස්ථාව (04) 05**

මහසභා රැස්වීමේ ගණපූර්ණය සාමාජිකයන් හැත්තෑපස් (75) දෙනෙකු වේ.

**වර්තමාන ව්‍යවස්ථාව (04) 06**

න්‍යාය පත්‍රයෙහි අඩංගුව ඇතොත් මිස කිසිම කටයුත්තක් සම්බන්ධයෙන් වාර්ෂික මහසභා රැස්වීමේදී සාකච්ඡා කිරීම හෝ ක්‍රියා කිරීම නොකළ යුතු ය.

**සංශෝධිත ව්‍යවස්ථාව (04) 06**

න්‍යාය පත්‍රයෙහි අඩංගුව ඇතොත් මිස කිසිම කටයුත්තක් සම්බන්ධයෙන් මහසභා රැස්වීමේදී සාකච්ඡා කිරීම හෝ ක්‍රියා කිරීම නොකළ යුතු ය.

**වර්තමාන ව්‍යවස්ථාව (04) 07**

වාර්ෂික මහසභා රැස්වීමේ දිනයේ සිට තුන් මසකට පසු නොවී වාර්ෂික මහසභා රැස්වීමේ වාර්තා පිටපතක්ද සහතික කරන ලද ගිණුම් පරීක්ෂක වාර්තාව සහ ශේෂ පත්‍රය ඇතුළු ගිණුම් සටහන්ද දුම්රිය සාමාන්‍යාධිකාරී තැන වෙත සහ ස්ථිර ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය.

**සංශෝධිත ව්‍යවස්ථාව (04) 07**

මහසභා රැස්වීමේ දිනයේ සිට තුන් මසකට පසු නොවී මහසභා රැස්වීමේ වාර්තා පිටපතක්ද සහතික කරන ලද ගිණුම් පරීක්ෂක වාර්තාව සහ ශේෂ පත්‍රය ඇතුළු ගිණුම් සටහන්ද දුම්රිය සාමාන්‍යාධිකාරී තැන වෙත සහ ස්ථිර ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය.

**වර්තමාන ව්‍යවස්ථාව (04) 08**

එක් වාර්ෂික මහසභා රැස්වීමක වාර්තාව ඊළඟට පැවැත්වෙන වාර්ෂික මහසභා රැස්වීමේදී ඉදිරිපත් කොට සම්මත කරවාගත යුතු ය.

**සංශෝධිත ව්‍යවස්ථාව (04) 08**

එක් මහසභා රැස්වීමක වාර්තාව ඊළඟට පැවැත්වෙන මහසභා රැස්වීමේදී ඉදිරිපත් කොට සම්මත කරවාගත යුතු ය.

**වර්තමාන ව්‍යවස්ථාව (10) ලේකම්/භාණ්ඩාගාරිකගේ යුතුකම්**

1. ක්‍රියාකාරක මණ්ඩලයේ ලේකම්/භාණ්ඩාගාරික වශයෙන් කටයුතු කළ යුතු අතර සියළුම රැස්වීම් කැඳවීමේ වගකීම දැරිය යුතු ය.
2. ක්‍රියාකාරක මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධිවිධානවලට යටත්ව සංගමයේ නියුක්ත කාර්යය මණ්ඩලය පිළිබඳ විනය පාලනය කළ යුතු ය.
3. සංගමයේ පරිපාලනයෙහි වගකීම දැරිය යුතු ය.
4. වර්ෂයක් පාසා සංගමයේ වාර්ෂික වාර්තාව පිළියෙළ කොට ඉදිරිපත් කළ යුතු ය.
5. සංගමයේ සියළු මුදල් සහ අරමුදල් සම්බන්ධයෙන් ගිණුම් පවත්වාගෙන යා යුතු ය.
6. සංගමයේ ව්‍යවස්ථාවලට යටත්ව ක්‍රියාකාරක මණ්ඩලය විසින් බලය පවරනු ලබන සියළු හිමිකම්පෑම් ණය අත්තිකාරම් මුදල් සහ වියදම් ගෙවිය යුතු ය.
7. මාසයක් පාසා සංගමයේ ගණුදෙනු පිළිබඳව ගිණුමක් පිළියෙළ කොට ක්‍රියාකාරක මණ්ඩලයේ රැස්වීමට ඉදිරිපත් කළ යුතු ය.
8. වර්ෂයක් පාසා සංගමයේ අරමුදල පිළිබඳව අය වැය ලේඛනයක් පිළියෙළ කොට ඉදිරිපත් කළ යුතු ය.

**සංශෝධිත ව්‍යවස්ථාව (10) 01 ලේකම්ගේ යුතුකම්**

1. ක්‍රියාකාරක මණ්ඩලයේ ලේකම් වශයෙන් කටයුතු කළ යුතු අතර සියළුම රැස්වීම් කැඳවීමේ වගකීම දැරිය යුතු ය.
2. ක්‍රියාකාරක මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධිවිධාන වලට යටත්ව සහ මගපෙන්වීමට අනුව සංගමයේ නියුක්ත කාර්යය මණ්ඩලය පිළිබඳ විනය පාලනය කළ යුතු ය.
3. ආඥාපනතට හා සංගමයේ නීති රීතිවලට අනුකූලව හා විධායක කමිටුවේ තීරණ හා විධිවිධාන වලට අනුකූලව සංගමයේ පරිපාලන කටයුතු සිදුකළ යුතු ය.
4. වර්ෂයක් පාසා සංගමයේ වාර්ෂික වාර්තාව පිළියෙළ කොට මහසභාවක් පැවැත්වෙන අවස්ථාවක දී අදාළ වාර්තා සියල්ල ඉදිරිපත් කළ යුතු ය.

**සංශෝධිත ව්‍යවස්ථාව (10) 02 භාණ්ඩාගාරිකගේ යුතුකම්**

1. සංගමයේ සියළු මුදල් සහ අරමුදල් සම්බන්ධයෙන් ගිණුම් පවත්වාගෙන යා යුතු ය.
2. සංගමයේ ව්‍යවස්ථාවලට යටත්ව ක්‍රියාකාරක මණ්ඩලය විසින් බලය පවරනු ලබන සියළු හිමිකම් පෑම් ණය අත්තිකාරම් මුදල් සහ වියදම් ගෙවිය යුතු ය.
3. මාසයක් පාසා සංගමයේ ගණුදෙනු පිළිබඳව ගිණුමක් පිළියෙළ කොට ක්‍රියාකාරක මණ්ඩලයේ රැස්වීමට ඉදිරිපත් කළ යුතු ය.
4. වර්ෂයක් පාසා සංගමයේ අරමුදල පිළිබඳව අය වැය ලේඛනයක් පිළියෙළ කොට ඉදිරිපත් කළ යුතු ය.

**වර්තමාන ව්‍යවස්ථාව (17) - 02**

මරණාධාර ඉල්ලුම් කිරීමේදී මරණ සහතිකය සහ ඊට අදාළ ලියකියවිලි පාලක මණ්ඩලය නියම කරන වෙනත් ලියකියවිලි ඉදිරිපත් කිරීමට සාමාජිකයා බැඳී සිටී. සාමාජිකයාගේ අභාවය සිදු වූ සැණින් ඔහුගේ නීත්‍යානුකූල උරුමකරු මරණාධාර මුදල් අයදුම් කරන්නේ නම් කාරක සභිකයින් තිදෙනෙකුගේ නිර්දේශය මත මරණාධාර මුදලින් 1/3 ක් ක්ෂණිකව ගෙවිය යුතු යි.

**සංශෝධිත ව්‍යවස්ථාව (17) - 02**

මරණාධාර ඉල්ලුම් කිරීමේදී මරණ සහතිකය සහ ඊට අදාළ ලියකියවිලි පාලක මණ්ඩලය නියම කරන වෙනත් ලියකියවිලි ඉදිරිපත් කිරීමට සාමාජිකයා බැඳී සිටී. සාමාජිකයාගේ හෝ ඔහුගේ යැපෙන්නෙකුගේ අභාවය සිදු වූ සැණින් ඔහුගේ නීත්‍යානුකූල උරුමකරු මරණාධාර මුදල් අයදුම් කරන්නේ නම් විධායක සභිකයින් තිදෙනෙකුගේ නිර්දේශය මත මරණාධාර මුදලින් 1/2 ක් ක්ෂණිකව ගෙවිය යුතු ය.

**වර්තමාන ව්‍යවස්ථාව (17) - 04**

සාමාජිකයාට ලැබෙන මරණාධාර මුදල රු40,000/- කි. සාමාජිකයාගේ/සාමාජිකාවගේ බිරිඳ/ස්වාමිපුරුෂයාගේ අභාවයකදී රු 30,000/- කි. සාමාජිකයාගේ/සාමාජිකාවගේ මව/පියා සාමාජිකයාගේ/සාමාජිකාවගේ බිරිඳ ගේ ස්වාමිපුරුෂයාගේ මව/පියා ගේ අභාවයකදී රු 25,000/- කි. සාමාජිකයාගේ/සාමාජිකාවගේ අවිවාහක දරුවෙකුගේ මරණයකදී රු 25,000/- ක මරණාධාර මුදලක් ගෙවනු ලැබේ. සාමාජිකයාට/සාමාජිකාවට මරණාධාර මුදල් ලබාගතහැක්කේ උපරිම වශයෙන් අවස්ථා 03 කදී පමණි. යම් කිසි සාමාජිකයෙකු සාමාජිකාවක තමන් විශ්‍රාම යන අවස්ථාව වන තෙක් කිසිම මරණාධාර මුදලක් ලබා නොගත්තේ නම් ඔහු හෝ ඇය විශ්‍රාම යන අවස්ථාවේ සංගමය සතු ඔහුගේ/ඇයගේ තැන්පත් මුදල ගෙවන විට හෝ ඔහුට හෝ ඇයට හිමි සම්පූර්ණ මරණාධාර මුදලද තැන්පතුවට එකතුකොට ගෙවිය යුතු ය. අවුරුදු 45-50 අතර සාමාජිකත්වය ලබාගන්නා අයවළුන්ට සාමාජිකත්වය සඳහා වූ රු 30,000/- ක මරණාධාර ප්‍රතිලාභයක් සහ සාමාජිකයාගේ/සාමාජිකාවගේ බිරිඳ/ස්වාමිපුරුෂයාගේ අභාවයකදී රු 20,000/-ක මරණාධාර ප්‍රතිලාභයක් සහ යැපෙන්නන් සඳහා රු 15,000/- ක ප්‍රතිලාභයක් හිමිවනු ඇත.

**සංශෝධිත ව්‍යවස්ථාව (17) - 04**

සාමාජිකයාට ලැබෙන මරණාධාර මුදල රු 50,000/- කි. සාමාජිකයාගේ/සාමාජිකාවගේ බිරිඳ/ස්වාමිපුරුෂයාගේ අභාවයකදී රු 30,000/- කි. සාමාජිකයාගේ/සාමාජිකාවගේ මව/පියා සාමාජිකයාගේ/සාමාජිකාවගේ බිරිඳ ගේ ස්වාමිපුරුෂයාගේ මව/පියා ගේ අභාවයකදී රු 25,000/- කි. සාමාජිකයාගේ/සාමාජිකාවගේ අවිවාහක දරුවෙකුගේ මරණයකදී රු 25,000/- ක මරණාධාර මුදලක් ගෙවනු ලැබේ. සාමාජිකයාට/සාමාජිකාවට සාමාජිකත්වයේ සිටියදී මරණාධාර පාරිතෝෂික මුදල් උපරිම සීමාවකින් තොරව ලබාගත හැක. යම් කිසි සාමාජිකයෙකු සාමාජිකාවක තමන් විශ්‍රාම යන අවස්ථාව වන තෙක් කිසිම මරණාධාර මුදලක් ලබා නොගත්තේ නම් ඔහු හෝ ඇය විශ්‍රාම යන අවස්ථාවේ සංගමය සතු ඔහුගේ/ඇයගේ තැන්පත් මුදල ගෙවන විට හෝ ඔහුට හෝ ඇයට හිමි සම්පූර්ණ මරණාධාර මුදලද තැන්පතුවට එකතුකොට ගෙවිය යුතු අතර සාමාජිකත්වයට හිමි මරණාධාර පාරිතෝෂිකයට වඩා අඩු මරණාධාර පාරිතෝෂිකයක් සාමාජිකත්වයේ සිටියදී යැපෙන්නන් වෙනුවෙන් ලබාගෙන ඇති සාමාජිකයෙකු හෝ සාමාජිකාවක ඔහු හෝ ඇය විශ්‍රාම යැමේදී ඔහුට හෝ ඇයට හිමි මරණාධාර පාරිතෝෂිකය දක්වා වූ ඉතිරි මුදල සාමාජිකයා හෝ සාමාජිකාව විශ්‍රාම යැමේදී ලබාගැනීමේ හැකියාව පවතී. අවුරුදු 45-50 අතර සාමාජිකත්වය ලබාගන්නා අයවළුන්ට සාමාජිකත්වය සඳහා වූ රු 40,000/- ක මරණාධාර පාරිතෝෂිකයක් සහ සාමාජිකයාගේ/සාමාජිකාවගේ බිරිඳ/ස්වාමිපුරුෂයාගේ අභාවයකදී රු 20,000/-ක මරණාධාර පාරිතෝෂිකයක් සහ යැපෙන්නන් සඳහා රු 15,000/- ක මරණාධාර පාරිතෝෂිකයක් හිමිවනු ඇත.

**වර්තමාන ව්‍යවස්ථාව (23) ත්‍යාග මුදල් 05**

ක්‍රියාකාරක මණ්ඩලයේ රැස්වීමක් සඳහා සහභාගී වන සෑම විධායක සභිකයෙකුටම දිනකට රු 200/- ක දීමනාවක් ගෙවිය යුතු ය.

**සංශෝධිත ව්‍යවස්ථාව (23) ත්‍යාග මුදල් 05**

ක්‍රියාකාරක මණ්ඩලයේ රැස්වීමක් සඳහා සහභාගී වන සෑම විධායක සභිකයෙකුටම දිනකට රු 500/- ක දීමනාවක් ගෙවිය යුතු ය.

**වර්තමාන ව්‍යවස්ථාව (23) ත්‍යාග මුදල් 06**

ක්‍රියාකාරක මණ්ඩලයේ රැස්වීමක් සඳහා සහභාගී වන සෑම නියෝජිතයෙකුටම දිනකට රු 200/- ක දීමනාවක් ගෙවිය යුතු ය.

**සංශෝධිත ව්‍යවස්ථාව (23) ත්‍යාග මුදල් 06**

ක්‍රියාකාරක මණ්ඩලයේ රැස්වීමක් සඳහා සහභාගී වන සෑම විධායක නියෝජිතයෙකුටම දිනකට රු 500/- ක දීමනාවක් ගෙවිය යුතු ය.

එස්. එම්. අබේවික්‍රම,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2018 අප්‍රේල් මස 28 වැනි දින.

05 - 499

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.